සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Free Evaluation Test – January 2021

පෙරහුරු පරීක්ෂණය - 2021 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
**Time :1 hour**

| 16 | S | I |
|---|---|---|

## Islam – I
## ඉස්ලාම් – I

Name :- ................................................... Grade : -................ Index number:-....................

- ❖ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. ''අකායිද් මගින් අප වටහා ගන්නා පූර්ණ අදහස වන්නේ,
   (1) ඉස්ලාමීය ප්‍රතිපත්ති වේ.
   (2) ඉස්ලාමීය මූලික විශ්වාසය පිළිබඳ විෂය වේ.
   (3) විශ්වාසය යන පදයේ බහු වචනය වේ.
   (4) ඉස්ලාමීය විශ්වාසය හා ඒ හා සම්බන්ධ විෂයෙහි බහුවචන නාම පදය වේ.

2. භූමිය සශ්‍රීක කිරීම යනු,
   (1) ඉමාරත් (2) ඉබාදත් (3) කිලාෆත් (4) හිදායත්

3. නබි ඊසා (අලෛ) තුමාට පහළ වූ ආගම වන්නේ,
   (1) තව්රාත් (2) සබූර් (3) ඉන්ජීල් (4) ෆුර්කාන්

4. අල් කුර්ආනයේ හැත්තෑවකට අධික ස්ථානවල පවසා තිබෙන ''සබ්ර්'' යන පදයේ අර්ථය වන්නේ,
   (1) සමාව (2) ඉවසීම (3) ධෛර්යය (4) කීකරු බව

5. ''යමෙක් ෆර්ලු වන සලාතයට පසු මෙය පරාරායනය කරන්නේ ද, ඔහු ඊළඟ සලාතයේ වේලාව පැමිණෙන තෙක් අල්ලාහ්ගේ රැකවරණයෙහි සිටින්නේ ය. යයි හදීස්වල පවසන්නේ කුමන පාරායනය ද?
   (1) යාසීන් (2) ආයතුල් කුර්සි
   (3) අල්ලාහුම්ම අජිර්නී මිනන් නාර් (4) සූරා ඉඃලාස්

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

6. ''අල් මාඋන් කසීර්'' යනු,
   (1) කුල්ලතෙයින් ප්‍රමාණයට වඩා අධික ජලය (2) අති පිරිසිදු ජලය
   (3) කුල්ලතෙයින් ප්‍රමාණයට වඩා අඩු ජලය (4) අපිරිසිදු ජලය

7. තම පවුල රැකබලා ගැනීම, වැඩිහිටියන්ට ගරු කිරීම ආදිය,
   (1) ෆර්ලු කිෆායා (2) සුන්නත් මුඅක්කදා
   (3) සුන්නත් කයිරු මුදක්කදා (4) ෆර්ලු අයින්

8. නබි (සල්) තුමාගෙන් පසුව පැමිණෙන ව්‍යාජ නබිවරුන්ගේ සංඛ්‍යාව කීයක් ලෙස, එතුමා විසින් පවසනු ලැබුවේ ද?
   (1) 6 (2) 10 (3) 32 (4) 30

9. ''ඉජ්මා'' යන්නට නොගැළපෙන පදය,
   (1) ඒකමතික තීරණය (2) එකඟ වීම
   (3) ස්ථිර කිරීම (4) සමාන කිරීම

10. නබි (සල්) තුමාගේ කාලයේ මක්කාවේ ඉස්ලාමීය දේශන කටයුතු සිදු වූ ස්ථානය,
   (1) දාරුල් ෆනා (2) දාරුල් බකා
   (3) දාරුල් අර්කම් (4) දාරුල් අක්රම්

11. ''වරඋ'' යන පදයේ අර්ථය,
   (1) එකඟ වීම (2) ඇල්මෙන් තොර වීම
   (3) මිශ්‍ර වූ සිත (4) පිළිවෙත් සුරැකීම

12. නබි (සල්) තුමා මදීනාවට යන විට මදීනා වැසියන් කෘෂිකර්මාන්තය සඳහා භාවිත කළ තාක්‍ෂණය වන්නේ,
   (1) පරාගනය (2) තවාන් කිරීම
   (3) රසායනික ද්‍රව්‍ය භාවිතය (4) බද්ධ කිරීම

13. ''ෂිර්කුල් අක්බර්'' හි අඩංගු නොවන දෙයකි,
   (1) හූනියම් කිරීම (2) මළවුල්ගෙන් ප්‍රාර්ථනා කිරීම
   (3) අල්ලාහ් නොවන දෙයකට භාර වීම (4) පිළිම වන්දනා කිරීම

14. ජාහිලියා කාල ආරාබි සමාජයේ ''ගෝත්‍ර'' හැඳින්වීම සඳහා භාවිත කළ වචනය,
   (1) ෂුඋෆබ් (2) කබීලා (3) ෂෙයිකු (4) අසබියියා

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

15. X හා Y තීරු යා කළ විට ලැබෙන නිවැරදි පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරන්න.

| X | Y |
|---|---|
| ඉමාම් ෂාෆිතුමා | A - සහීහ් මුස්ලිම් |
| ඉමාම් අබූ හනීෆාතුමා | B - මුවත්තා |
| ඉමාම් මුස්ලිම්තුමා | C - කිතාබ් අල් උම්මු |
| ඉමාම් මාලික්තුමා | D - ෆික්හුල් අක්බර් |

(1) A B C D (2) A D C B (3) B C D E (4) C D A B

16. යම් භාණ්ඩයක් විකුණන විට එහි ගැනුම් මිල ලාභය ආදිය පාරිභෝගිකයා දැන සිටි විටක දී සිදුවන වෙළඳ ක්‍රමය කුමක් ද?

(1) මුෂාරකා (2) මුළාරබා (3) මුදාරදා (4) මුරාබහා

17. මිනිසා විසින් සකස් කරන ලද මානව අයිතිවාසිකම්වල නොතිබෙන ලක්ෂණයක් වන්නේ,

(1) කලින් කලට කාලයෙන් කාලයට වෙනස් වේ.
(2) බලයෙන් හෝ වෙනයම් ක්‍රමයකට අවලංගු නොවේ.
(3) සමානාත්මතාවය නොමැත.
(4) ලේඛනයට සමණක් සීමා වේ.

18. හජ් හි ක්‍රියාවන් සිදුකරනු ලබන කාලය,

(1) දුල්හජ් 11 සිට 12 දක්වා (2) දුල්හජ් 10 සිට 13 දක්වා
(3) දුල්හජ් 08 සිට 13 දක්වා (4) දුල්හජ් 01 සිට 13 දක්වා

19. මිනිසාට ක්‍රියා නිදහස ලබා දී ඇති නිසා ඔහු කරන හොඳ හා නරක ක්‍රියාවලට,

(1) අල්ලාහ් වගකිව යුතු ය. (2) මිනිසා වගකිව යුතු ය.
(3) දෙමව්පියන් වගකිව යුතු ය. (4) සමාජය වගකිව යුතු ය.

20. අනුමත ගමනක යෙදී එය සම්පූර්ණ කිරීමට නොහැකි වන අය zසකාත්වලින් හඳුන්වන්නේ,

(1) අර් රිකාබ් (2) ෆීසබිලිල්ලාහ් (3) ඉබ්නු සබීල් (4) ආබිල්

21. "ඇත් වී සිටීම - වැළකී සිටීම" යන අදහස ගෙන දෙන ඉස්ලාමීය වගකීම වන්නේ,

(1) සලාතය (2) zසකාත් (3) උපවාසය (4) හජ්

22. "සුබාහාන රබ්බිල් අලීම් වබිහම්දිහි" යන පාරායනය පවසන්නේ සලාතයේ කුමන ඉරියව්වේ දී ද?

(1) තක්බීර් බඳින අවස්ථාවේ දී (2) රුකූඋවල දී
(3) සුජූද්වල දී (4) මැද ඉඳුමේ දී

23. පරිපාලන කටයුතු සරල කිරීමට ප්‍රාදේශීය මට්ටමේ බොහෝ පරිපාලන ඒකක ඇති කළ කලීෆාවරයා,

(1) අබූ බක්කර් (රලි) තුමා (2) උමර් (රලි) තුමා

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(3) උස්මාන් (රලි) තුමා (4) අලි (රලි) තුමා

24. අල් කුලෆාඋර් රාෂිින්දූන්වරු අතරින්, දීර්ඝ කාලයක් පාලනය කළ කලීෆාවරයා වන්නේ,

(1) අබු බක්කර් (රලි) තුමා (2) උමර් (රලි) තුමා

(3) උස්මාන් (රලි) තුමා (4) අලි (රලි) තුමා

25. තලාක් ''ලිආන්'' යනු,

(1) බිරිඳව ශාරීරිකව මවට සමාන කිරීමෙන් ඇතිවන දික්කසාදය

(2) බිරිඳ සමග සබඳතා නොපවත්වන බවට දිවුරා කීම

(3) බිරිඳට දුරාචාර චෝදනාව එල්ල කර ඇතිවන දික්කසාදය

(4) බිරිඳගෙන් වෙන් වීමට දික්කසාද ගන්නා අවස්ථාවේ දී පවසන වචනය ය.

26. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් ද, දේශපාලන නියෝජිතයකු වශයෙන් ද සිට රටට සේවය කළ පුද්ගලයා,

(1) එම්.සී.එම්. සිද්දි ලෙබ්බෙ මහතා (2) ආචාර්ය ටී.බී. ජයා මහතා

(3) ඔරාබි පාෂා මහතා (4) මුල්ක් රහ්මතුල්ලාහ් මහතා

27. ''ඉමාමුල් අහ්ලම්'' යන ගෞරව නාමයෙන් අමතනු ලබන ඉමාම්වරයා,

(1) ඉමාම් අබු හනීෆා තුමා (2) ඉමාම් මාලික් තුමා

(3) ඉමාම් ෂාෆි තුමා (4) ඉමාම් අහමද් තුමා

28. කුරුස යුද්ධයේ සේනාවෙන් මස්ජිදුල් අක්සාව නිදහස් කරගත් නායකයින්ගෙන් කෙනෙකි,

(1) උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා (2) සලාහුද්දීන් අයියුබි තුමා

(3) අල් ෆාතිහ් තුමා (4) අබ්දුල්ලාහ් බින් කාසිම් තුමා

29. ''කිතාබුල් උම්මු, අර් රිසාලතුල් උලුහියියා'' යන හදීස් ග්‍රන්ථ රචනා කළ ඉමාම්වරයා,

(1) ඉමාම් අබු හනීෆා (රහ්) තුමා (2) ඉමාම් ෂාෆි (රහ්) තුමා

(3) ඉමාම් මාලික් (රහ්) තුමා (4) ඉමාම් හම්බල් (රහ්) තුමා

30. හවුල් ව්‍යාපාර යන අදහස ගෙන දෙන ව්‍යාපාර ක්‍රමය,

(1) මුළාරබා (2) මුෂාරකා (3) මුරාබහා (4) මුආමලා

31. බිරිඳ සැමියාගෙන් විවාහ බන්ධනයෙන් නිදහස ඉල්ලා සිටීමේ දික්කසාද ක්‍රමය හඟවන අරාබි පදය වන්නේ,

(1) තලාක් (2) ෆස්හු (3) කුල්උ (4) ලිහාර්

32. අල් කුර්ආනය ඉදිරියේ තම නොහැකියාව පිළිගෙන කවි කීමෙන් වැළකී සිටි බවට පැවසෙන කවියා වන්නේ,

(1) අබු ජහල් (2) අබු සුෆියාන් (3) වලීද් (4) ලබීද්

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

33. නබි (සල්) තුමාණන් ''මා ඔබ වෙත කරුණු දෙකක් හැරයමි. ඒ දෙක අනුගමනය කරන කාලය තුළ ඔබ නොගම යන්නේ නැත.'' යයි පැවසුවේ ය. එයින් එක් කරුණක් වන්නේ අල් කුර්ආනයය යි. අනෙක් කරුණ වන්නේ,

(1) සහාබාවරුන්ගේ (2) මාගේ මගපෙන්වීම

(3) නබිවරුන්ගේ මගපෙන්වීම (4) මුජ්තහිද්වරුන්ගේ මගපෙන්වීම

34. ''කාතමුත් නබීයින්'' යන්නෙහි අදහස වන්නේ,

(1) මිනිසුන් අතරින් ශ්‍රේෂ්ඨයා වේ. (2) නබිවරුන් අතරින් අවසානයා වේ.

(3) නබිවරුන් අතරින් නායකයා වේ. (4) නබිවරුන්ගේ මුද්‍රාව වේ.

35. ගෙපිල මිතුරන් හැඳින්වීමට භාවිත වන අරාබි පදය වන්නේ,

(1) අහ්ලුල් කිතාබ් (2) අහ්ලුල් බයිත්

(3) අස්හාබුස් සුෆ්ෆා (4) කුත්තාබුල් වහී

36. ''ෆිත්හුල් අව්ලවියියාත්'' යන්නෙන් අදහස් කරන්නේ,

(1) ප්‍රමුඛතාවය දිය යුතු අංග (2) නීති මූලාශ්‍ර

(3) මධ්‍යස්ථභාවය රැකීම (4) ෆික්හු ක්ෂේත්‍රයේ විද්වතුන්

37. නබි (සල්) තුමාගේ ''සංවෘත සන්නිවේදනයට'' නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,

(1) අතින් පොළොවේ ඍජු රේඛාවක් ඇඳීම.

(2) තම මැදගිල්ල හා දබරැගිල්ල එකතු කර පෙන්වීම.

(3) ලිපි හා දූතයින් යොදා ගැනීම.

(4) හජ් හි අරෆා දේශනය.

38. විවාහය සඳහා තාවකාලිකව තහනම් නොකළ අය වන්නේ,

(1) මුෂ්රික් වූ කාන්තාව

(2) විවාහකව සිටින කාන්තාව

(3) සමකාලයේ එකට උපන් සහෝදරිය

(4) ස්ත්‍රියක හා ඇයගේ මවගේ සහෝදරියගේ දියණිය

39. මුඃතසිලාවරුන්ගේ අදහස් පැතිර පැවතුණේ කුමන ඉමාම්වරයාගේ කාලයේ දී ද?

(1) ඉමාම් ෂාෆි (රහ්) තුමාගේ (2) ඉමාම් මාලික් (රහ්) තුමාගේ

(3) ඉමාම් අබු හනීෆා (රහ්) තුමාගේ (4) ඉමාම් අහමද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ

40. ''සකීෆතුල් බනී සාහිදා'' යන ස්ථානය කුමන කලීෆාවරයාගේ තෝරා පත්කර ගැනීම සඳහා සම්බන්ධ වන්නේ ද?

(1) අබු බක්කර් (රලි) තුමා (2) උමර් (රලි) තුමා

(3) උස්මාන් (රලි) තුමා (4) අලි (රලි) තුමා

(ලකුණු $1 \times 40 = 40$)

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Free Evaluation Test – January 2021
පෙරහුරු පරීක්ෂණය - 2020 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hours**

| 16 | S | II |
|---|---|---|

## Islam – II
## ඉස්ලාම් – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

**පළමු වන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න 4ක් ඇතුළු ව ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතු ය.**
**පළමු වන ප්‍රශ්නයට ලකුණු 20ක් ද තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) මූලික නිශ්චිත ඉබාදත් සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(ii) ''අල් මාඋත් තාහිර්'' ජල වර්ගය සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(iii) ඇබිසීනියාව (හබෂා) වෙත හිජ්රත් සිදු කළ වසර දෙක නම් කරන්න.

(iv) සලාතයේ වැදගත්කම පෙන්නුම් කරන හදීසයක් සඳහන් කරන්න.

(v) ආදරය දැක්වීමෙහි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(vi) ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප දෙක කවරේ ද?

(vii) ''ඊජාබ් හා කබූල්'' සිදු වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(viii) ''ආමුල් හුස්න්'' හා සම්බන්ධ සිදුවීම් දෙකක් ලියන්න.

(ix) ''මහ්රම්-අජ්නබි'' යන පද දෙක පැහැදිලි කරන්න.

(x) වහී කෙරෙ මත්ලුව්වු සඳහා නිදසුන් අවස්ථා දෙකක් ලියන්න.

(2) (i) ''තව්හිද්'' යන පදයේ වචනාර්ථ දෙකක් ලියන්න.

(ii) ''ෂිර්කුල් අස්කර්'' සඳහා නිදසුන් තුනක් ලියන්න.

(iii) අවසාන නබීත්වය පිළිබඳ අල් කුර්ආන් හෝ අල් හදීස් මූලාශ්‍රයක් සහිතව විස්තර කරන්න.

(3) (i) zසකාත් හි ෆර්ලු දෙක සඳහන් කරන්න.

(ii) zසකාත් ලැබීමට හිමිකම් නොමැති කාණ්ඩ තුනක් සඳහන් කරන්න.

(iii) හජ් ඉටුකරන ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

(4) (i) මූඃමින්වරයකු තුළ තිබිය යුතු යහ ගුණාංග පිළිබඳ සඳහන් වන අල් කුර්ආන් සූරා දෙක කුමක් ද?

(ii) ඉස්ලාමීය විද්වතුන් පෙන්වා දෙන සිතෙහි පවතින තත්ත්වයන් තුන කවරේ ද?

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

(iii) අප මූලික නිශ්චිත ඉබාදත් මගින්, යහපත් හැසිරීම් රටාවකට පුහුණුව ලබන්නේ කෙසේ ද? යන්න පැහැදිලි කරන්න.

(5) (i) අල් කුර්ආනය ප්‍රාථමික මූලාශ්‍රයක් නිසා එය පදනම් කර ගනිමින් පිළිවෙත් ගොනුකර ගැනීම සඳහා පෙන්වා දී ඇති ෂරීආ නීතිවල දක්නට ලැබෙන ගුණාංගයන් දෙක කවරේ ද?

(ii) සහාබාවරු නබි (සල්) තුමාගේ උපදෙස්, ක්‍රියාවන් හා අනුමත කළ දේවල් හොඳින් අවධානය කළ හ. මෙහි උපදෙස් ක්‍රියාවන් හා අනුමත කළ දේවල් යන කරුණු සඳහා භාවිත කළ හැකි අරාබි වචන තුන නම් කරන්න.

(iii) ඉජ්තිහාද් කරනු ලබන මුජ්තහිද්වරුන් තුළ තිබිය යුතු ලක්ෂණ පහක් සඳහන් කරන්න.

(6) (i) අබු බක්කර් (රලි) තුමා කලීෆා පදවිය භාරගත් පසු මුහුණදීමට සිදු වූ අභියෝග දෙකක් ලියන්න.

(ii) ඉස්ලාම් ධර්මය අරාබි දේශයේ බිහිවීමට පෙර සිට ම අරාබියානුවන් හා ශ්‍රී ලාංකිකයන් අතර සම්බන්ධතා පැවති බවට හේතු සාධක තුනක් සඳහන් කරන්න.

(iii) මුස්ලිම් උම්මත්වරුන් ලෙස අප, අපගේ මව්බිමෙහි අනුගමනය කළ යුතු මගපෙන්වීම් පහක් ලියන්න.

(7) පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) අල් කුර්ආනය ආශ්චර්යයකි

(ii) අල් මාඋත් තහූර්

(iii) මස්ජිදුන් නබවී

(iv) නබි (සල්)තුමාගේ දෑවාව හා අභියෝග